**06-10-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ශ්‍රීමත් අනුගමනය කොට, භාරතය දිව්‍යලෝකයක් බවට පත් කිරීම සඳහා සේවය කරන්න. පළමුව ඔබ දුර්ගුණ වලින් තොර වී ඉන්පසු අන් අයට එසේ වන ලෙස කියන්න.

**ප්‍රශ්නය:** ඔය මහාවීර දරුවන් සැළකිලිමත් නොවිය යුත්තේ කුමක් පිළිබඳවද? තමන්ව පරීක්ෂා කරන අතර තුරදී ඔබ බැලිය යුත්තේ කුමන කාරණාව පිළිබඳවද?

**පිළිතුර:** යම් කෙනෙක් තමන්ට පාරිශුද්ධ වීමට බාධක පමුණුවන්නේ නම්, ඒ පිළිබඳව සැළකිල්ලක් නොදක්වා, තමන් මහාවීරයෙක් වෙනවාද කියා පමණක් පරීක්ෂා කර බලන්න. මා මාවම රවටා ගන්නවාද? මට අසීමිත නිරාශාවන් තිබේද? මා අන් අයව මා හා සමාන කරවන්නේද ? මා තුළ කෝපය තිබේද? මා අන් අයට කරන්නට කියනා දේ, මා කරන්නේද ?

**ගීතය:** ඔබව හමු වීමෙන් අපට මුළු ලොවම හමු වී තිබේ. මහ පොළවත්, අහසත් මේ සියල්ලම අයත් වන්නේ අපටයි!

ඕම් ශාන්ති. මෙහිදී මෙය කීමට අවශ්‍ය වන්නේ නැත; එය වටහා ගැනීම පිළිබඳ කාරණාවකි. ඔය සුමිහිරි ආධ්‍යාත්මික දරුවන්ට ඔබ නැවත වතාවක් දෙවි දේවතාවන් බවට පත්වන බව, එනම්, ඔබ සම්පූර්ණයෙන්ම දුර්ගුණ වලින් තොර වන බව වැටහේ. පරම පියා පැමිණ පවසන්නේ දරුවනි, රාගය ජයගන්න! එනම්, පාරිශුද්ධ වන්න! ඔය දරුවන් ගීතය ඇසුවේය. ඔබගේ අසීමිත උරුමය අසීමිත පියාගෙන් හිමි කරගත් බව ඔය දරුවන්ට නැවතත් සිහිපත් වී ඇත. කිසිවෙකුට එය ඔබගෙන් උදුරා ගත නොහැක. ඔබගෙන් එය උදුරා ගත හැකි කිසිවෙක් නොමැත. එයට කියන්නේ නොබෙදුනු රාජධානිය කියායි. ඉන්පසු, පසුකලෙක රාවණ්ගේ රාජධානිය වෙනත් අයට අයත් වෙයි. ඔබට දැන් මෙය වැටහෙයි. ඔබ ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් නැවත වතාවක් භාරතය දුර්ගුණ වලින් තොර බවට පත් කරවන බව එලෙසින්ම විස්තර කළ යුතුයි. පරමාත්ම දෙවියන් උසස්ම උසස් බව සැම කෙනෙක්ම කියයි. ඔහුට පමණයි පරම පියා යැයි කියන්නේ. එබැවින් ඔබ මෙයද විස්තර කොට, සම්පූර්ණයෙන්ම දුර්ගුණ වලින් තොර දෙව්ලොව ව පැවතුණු භාරතය, දැන් දූෂිත අපාය බවට පත් වී ඇති බව ලිවිය යුතුයි. අප ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් භාරතය නැවත වතාවක් දෙව්ලොව බවට පත් කරවන්නෙමු. මේවා ලිවීමට ඔබට උපකාර වීම සඳහා, පරම පියා ඔබට කියන දේවල් සටහන් කරගෙන ඥාන සාගරය කලතන්න. භාරතය සැබැවටම දෙව්ලොවක්ව පැවතුණු බව මිනිසුන්ට වටහා ගැනීමට, අප ලිවිය යුත්තේ කුමක්ද? එකළ රාවණ්ගේ රාජධානියක් නොතිබිණි. පරම පියා, භාරතයේ වැසියන් වන අපව, දුර්ගුණ වලින් තොර අය බවට පත් කරවන බව ඔය දරුවන්ගේ බුද්ධියෙහි ඇත. පළමුව තමන්ව පරීක්ෂා කර බලන්න 'මා දුර්ගුණ වලින් තොර වී ඇත්ද ?'මා පරමාත්ම දෙවියන්ව රවටනවාද?' 'පරමාත්ම දෙවියන් මා දෙස බලා සිටින්නේ නැත.' එවැනි වදන් ඔබගේ මුවින් පිට නොවිය යුතුයි. ඔබ දන්නවා එකම පාරිශුද්ධකරු වන පියාට පමණයි ඔබව පාරිශුද්ධත්වයට පත්කරවිය හැක්කේ කියා. භාරතය දුර්ගුණ වලින් තොරව පැවතුණු කළ එය දෙව්ලොව වීය. ඔවුන් සම්පූර්ණයෙන්ම දුර්ගුණ වලින් තොරව සිටියේය. එසේ නොවේද? රජ සහ රැජිණ කෙලෙසද, වැසියන්ද එසේම වීය. එවිට පමණයි මුළු භාරතයටම දෙව්ලොව යැයි කියන්නේ. එය දැන් අපායයි. උපත් 84 පෙන්වන, ඉනිමගේ පිංතූරය ඉතා හොඳ එකකි. හොඳ කෙනෙකුට තෑග්ගක් වශයෙන් ඔබට එය දෙන්නට පුළුවනි. ප්‍රභූවරුන්ට විශේෂ තෑගි ලැබෙයි. එබැවින් ඔබට ද මෙහි පැමිණෙන අයට මෙම පිංතූරය විස්තර කොට එය තෑග්ගක් ලෙස පිරිනැමිය හැක. ඔබ සැම විටම දීමට දේවල් සූදානම් කොට තබා ගත යුතුයි. ඥානය ද ඔබ තුළ සූදානමින් තිබිය යුතුයි. මුළු ඥානයම ඉනිමගෙහි ඇත. ඔබ උපත් 84 ක් ගෙන ඇති අයුරු සිහිපත් කරන්න. මෙය වටහා ගත යුත්තක්. මුලදී පැමිණුනු අය අනිවාර්යෙන්ම උපත් 84 ක් ගෙන ඇත. පරම පියා ඔබට ඔබගේ උපත් 84 ගැන කියා දී ඉන්පසු මෙසේ කියයි මම මෙම කෙනාගේ උපත් රාශියක අවසන් උපතේදී ඔහුගේ සාමාන්‍ය ශරීරය තුළට ඇතුළු වන්නෙමි. මම ඔහුට බ්‍රහ්මා කියා නම් තබන්නෙමි. මම ඔහුගේ මාර්ගයෙන් බ්‍රහ්මිණ්වරුන් නිර්මාණය කරන්නෙමි. නැත්නම් මම කොහෙන් බ්‍රහ්මිණ්වරුන් ගේන්නද? ඔබ බ්‍රහ්මාගේ පියා ගැන කවදා හෝ අසා ඇත්ද ? ඔහු පරමාත්ම දෙවියන් බව අනිවාර්යෙන්ම කියනු ලැබේ. බ්‍රහ්මා සහ විශ්ණු සූක්ෂම දේශයේ පෙන්වා තිබේ. පරම පියා පවසන්නේ මම මොහුගේ උපත් 84 හි අවසාන උපතේදී ඔහු තුළට ඇතුළු වන්නෙමි. කෙනෙක් හදා ගන්නා විට ඔහුගේ නම

වෙනස් කෙරෙයි. ඔහු ලවා අත්හැරීම සිදු කරවයි. සන්‍යාසීන් අත්හැර යන විට, ඔවුන් සෑම දෙයක්ම මොහොතකින් අමතක කරන්නේ නැත ඔවුන්ට අනිවාර්යෙන්ම සමහර දේවල් මතක් වෙයි. ඔබටද සමහර දේවල් මතක් වෙයි, එහෙත් සෑම දෙයක්ම සොහොන් පිටියක් බවට පත්වන්නට යන බව දන්නා නිසා ඔබට ඒවා ගැන අසීමිත නිරාශාවක් ඇති වෙයි. එබැවින් ඔබ ඒවා මතක් කරන්නේ කුමකටද? සෑම දෙයක්ම හොඳින් වටහා ගැනීම සඳහා අපට ඥානය තිබේ. ඔවුන්ද ඔවුන්ගේ ගෙවල් ආදිය අත්හරින්නේ ඥානය ඇතිවයි. ඔවුන්ගේ නිවෙස් අත්හළේ කෙසේදැයි ඔබ ඔවුන්ගෙන් ඇසුවේ නම් ඔවුන් එය නොකියනු ඇත. එවිට ඔබට ඔවුන් සමඟ උපායශීලීව කතා කොට ඔබට නිරාශාව ඇතිවූයේ කෙසේද? අපටත් කියන්න. එවිට අපටත් එයම කළ හැක. පාරිශුද්ධ වීමට ඔබ අපව පොළඹවයි. කෙසේවෙතත්, ඔබගේ අතීතයේ සෑම දෙයක්ම ඔබට මතක් වෙයි. ඔවුන්ට තම ළමා කාලයේ සිට සිදු වූ සෑම දෙයක්ම ඔබට කිව හැක. ඔබ මෙම නාටකයේ කොටසක් රඟපාන නළුවන්ය යන මුළු ඥානයම ඔබගේ බුද්ධියේ ඇත. ඔබගේ කලි යුගයේ සෑම කර්ම බැඳීමක්ම දැන් බිඳ දැමිය යුතුයි. එවිට ඔබ සාමයේ දේශයට යයි. එතැන් පටන් සෑම කෙනෙකුටම නව සම්බන්ධකම් ඇති වෙයි. විස්තර කිරීම සඳහා බාබා ඔබට දිගින් දිගටම හොඳ කරුණු කියා දෙයි. ආදී සනාථන දෙව් දේවතා ධර්මයට අයත් වූ එම භාරත ජනයා සම්පූර්ණයෙන්ම දුර්ගුණ වලින් තොර විය. දැන් උපත් 84 ක් ගැනීමෙන් අනතුරුව ඔවුන් දූෂිත වී ඇත. ඔවුන් දැන් නැවතත් දුර්ගුණ වලින් තොර විය යුතුයි. කෙසේවෙතත්, ඔවුන්ට උත්සාහ කිරීමට දිරි ගැන්වීම සඳහා අනිවාර්යෙන්ම කෙනෙක් අවශ්‍යයි. පරම පියා දැන් ඔබට සෑම දෙයක්ම පෙන්වා දී තිබේ. පරම පියා පවසන්නේ ඔබ එම අයමයි, එසේ නොවේද? දරුවන්ද පවසන්නේ බාබා, ඔබ එම කෙනාමයි. පරම පියා පවසන්නේ මම පෙර චක්‍රයේ දී ඔබට උගන්වා රාජධානියේ භාග්‍යය ඔබට ලබා දුන්නෙමි. මම සෑම චක්‍රයකදීම එම දේම නොකඩවා කරන්නෙමි. නාටකයේ කුමක් සිදුවූණේද, පෙර කුමන බාධක තිබුණේද, එම බාධකම නැවතත් ඇති වේ. ඔබගේ ජීවිතයේ සිදුවන ඕනෑම දෙයක් මතක් කිරීමට ඔබට හැකියාව තිබේ. මෙම කෙනාට සෑම දෙයක්ම මතකයි. ඔහු ගමේ ගැටයෙක්ව සිටි අයුරු සහ ඉන්පසු ලොවට අධිපති වූ අයුරු ඔබට කියයි. පාරාදීසයේ කුමන අන්දමේ ගම්මානයක් තිබෙයිද කියා ඔබට වැටහෙන්නේ දැනුයි. මේ කාලයේ මෙම පැරණි ලොව ඔබට ගම්මානයක් මෙනි. පාරාදීසය සහ අපාය අතර විශාල වෙනසක් ඇත. විශාල මාළිගා සහ ගොඩනැගිලි දකින විට මිනිසුන් සිතන්නේ මෙය දිව්‍ය ලෝකය කියාය. පරම පියා පවසන්නේ මේ සෑම දෙයක්ම මැටි සහ ගල්ය. එහි වටිනාකමක් නොමැත. වැඩිම වටිනාකමක් ඇත්තේ දියමන්ති වලටයි. පරම පියා පවසන්නේ සිතන්න, ස්වර්ණමය යුගයේ රත්තරං වලින් සැදුණු ඔබලාගේ මාළිගා කෙසේ වන්නට ඇත්ද? එහි සෑම ආකාරයක්ම පිරී පැවතිණි. එහි බොහෝ රත්තරං තිබුණි. එබැවින් ඔය දරුවන් බොහෝ සතුට අත්විඳිය යුතුයි! බාබා විස්තර කරයි ඔබ මැලවෙන බව දැනෙන ඕනෑම විටෙක, වාදනය කිරීමෙන් ඔබට මොහොතකින් සතුට ගෙන දෙන සමහරක් ගීත තැටි තිබේ. එවිට මුළු ඥානයම ඔබගේ බුද්ධියට ඇතුළු වෙයි. බාබා ඔබව ලොවට අධිපතියන් බවට පත්කරවන බව ඔබට වැටහෙයි. කිසිවෙකුට එය ඔබගෙන් උදුරා ගත නොහැක. අපි චක්‍රයෙන් භාගයක් සතුටු දේශයේ අධිපතියන් බවට පත්වන්නෙමු. තමන් සීමිත රාජධානියක උරුමක්කාරයා බව රාජ කුමාරයෙකුට වැටහෙයි. ඔබ අසීමිත පියාගේ උරුමකරුවන් වීම ගැන ඔබ තුළ බොහෝ කුල්මත්භාවයක් තිබිය යුතුයි. පරම පියා දිව්‍ය ලෝකය ස්ථාපනය කරන අතර ඔබ උපත් 21 කට උරුමකරුවන් බවට පත් වෙමින් සිටින්නේය. ඔබ බොහෝ සෙයින් සතුටු විය යුතුයි! ඔබ උරුමකරුවන් වූ කෙනාවද අනිවාර්යෙන් සිහිපත් කළ යුතුයි. ඔහුව සිහිපත් නොකොට ඔබට උරුමකරුවන් විය නොහැක. ඔහුව සිහිපත් කළ විට පමණයි ඔබට පාරිශුද්ධ වී ඉන්පසු උරුමකරුවන් බවට පත් වීමට හැකි වන්නේ. ඔබ දන්නවා ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් ඔබ ද්විත්ව ඔටුනු පළඳින, ලොව අධිපතියන් බවට පත්වන බව උපතින් උපතට ඔබ රාජධානියක් පාලනය කරයි. භක්ති මාර්ගයේ මිනිසුන් විනාශ වන පරිත්‍යාග සහ විනාශයට පත්වන සුළු පුණ්‍යකර්ම කරයි. ඔබගේ ඥාන ධනය අවිනාශීයි. ඔබ බොහෝ විශාල ලොතරැයියක් දිනා ගනී. ඔබ සිදු කරන කර්ම වලට අනුව ඵල නෙලයි. මහ රජෙකුගේ පුතෙක් වන කෙනෙක් විශාල සීමිත ලොතරැයියක් දිනා ඇති බව කියැවේ. තනි ඔටුන්නක් පමණක් පැළඳි අයට මුළු ලොවෙහිම අධිපතියන් විය නොහැක. ඔබ ද්විත්ව ඔටුනු පළන් ලොවෙහි අධිපතියන් බවට පත්වෙයි. එම කාලයේදී වෙනත් රාජධානි නොමැත. අනිත් සෑම ආගමක්ම එන්නේ පසුවයි. එම ආගම් පැතිරෙන තුරු, මුල් රජවරුන් දූෂිත වීම හේතුවෙන් එකිනෙකා සමඟ සටයන ඇති කර, සෑම දෙයක්ම බෙදා වෙන්කර ගනී. මුලදී, මුළු ලොව පුරාම තිබුණේ එක් රාජධානියක් පමණයි. එහෙදී එය පෙර උපතේදී කළ කර්මයේ ඵල විපාකය යැයි නොකියයි. ශ්‍රේෂ්ඨ ක්‍රියා සිදු කරන අන්දම පරම පියා දැන් ඔය දරුවන්ට කියා දෙයි. ඔබ කරන ඕනෑම ක්‍රියාවකට, සහ කරන ඕනෑම සේවයකට, එයට අනුකූල ප්‍රතිඵලය ලැබෙයි. ඔබ යහපත් ක්‍රියා සිදු කළ යුතුයි. ඔබට නොවැටහෙන ක්‍රියා සිදු කිරීමට වනවානම් එවිට ශ්‍රීමත් ගන්න. ඔබ නැවත

නැවතත් ලිපි මාර්ගයෙන් විමසිය යුතුයි. බලන්න අගමැති දෙස! ඔහුට කොතරම් ලිපි සංඛ්‍යාවක් ලැබෙනවාද කියා ඔබට වටහා ගත හැක. කෙසේවෙතත්, ඔහුම ඒ සෑම එකක්ම කියවන්නේ නැත. ඔහුගේ ලිපි කියවීමට ලේකම්වරුන් බොහෝ සිටිති. ලේකම්වරුන් අගමැතිගේ මේසය උඩ තබන්නේ වැදගත් ලිපි පමණයි. මෙහිද ඊට සමානය. බාබා වැදගත් ලිපි වලට එසැනින්ම ප්‍රතිචාර දක්වයි. අනෙක් අයව බාබා නිකම් සෙනෙහසින් මතක් කරනවා පමණි. බාබාට අසුන් ගෙන වෙන වෙනම සෑම ලිපියකටම පිළිතුරු ලිවීම කළ නොහැක්කක්, එය ඉතා අපහසුයි. ඔය දරුවන් බොහෝ සතුට අත් විඳියි ඔහෝ! අද මට අසීමිත පියාගෙන් ලිපියක් ලැබී තිබේ! ශිව් බාබා ප්‍රතිචාර දක්වන්නේ බ්‍රහ්මා මාර්ගයෙන්ය. ඔය දරුවන් බොහෝ සතුට අත් විඳියි. බන්ධන තුළ සිර ගත වී සිටින අයයි වැඩියෙන් සතුටේ කුල්මත්භාවය අත් විඳින්නේ. ඔහෝ! මම බන්ධන අතර සිටියි, එහෙත් අසීමිත පියා මට ලිපියක් ලියා ඇත! ඔවුන් ලිපිය ඔවුන්ගේ දැස් මත තබයි. අවිදූ මාර්ගයේ භාර්යාවක් තම සැමියා තමන්ගේ දෙවියන් යැයි සළකයි. එබැවින් ඔහුගෙන් ඇය ලිපියක් ලද විට ඇය එය ඉඹියි. ඔය දරුවන් අතරින් බොහෝ දෙනෙකු ද බාප්දාදාගෙන් ලිපියක් ලද විට, ඇඟේ හිරිගඩු පිපෙන බව අත්විඳියි. ඔවුන්ගේ දෑසට සෙනෙහසේ කඳුළු නැඟෙයි. ඔවුන් ලිපිය ඉඹ එය ඔවුන්ගේ දෑස් මත තබයි. ඔවුන් බොහෝ සෙනෙහසින් ලිපිය කියවයි. බන්ධන තුළ සිර වී සිටින අය ද මෙලෙසය. මායා සමහර දරුවන් පරාජය කරයි. සමහරුන්ට තමන් අනිවාර්යෙන්ම පාරිශුද්ධව සිටිය යුතු බව වැටහෙයි. භාරතය දුර්ගුණ වලින් තොර විය. එය දැන් දූෂිතය. දුර්ගුණ වලින් තොර වීමට උවමනා අය පෙර චක්‍රයේ දී දැරූ උත්සාහය එම අයුරින්ම දරයි. ඔය දරුවන්ට විස්තර කිරීමට ඉතා පහසු ක්‍රමයක් තිබේ. මෙය ඔබගේ ද සැලස්මයි. මෙය දැන් ගීතාවේ යුගයයි. 'වඩාත්ම ශ්‍රේෂ්ඨ වූ ගීතාවේ යුගය' සිහිපත් කර ඇත. ඔබ මෙසේ ලිවිය යුතුයි පැරණි ලොව අළුත් ලොවක් බවට පරිවර්ථනය වෙන, වඩාත්ම ශ්‍රේෂ්ඨ වූ ගීතාවේ යුගය මෙයයි. ඔබගේ ගුරුවරයා ද වන අසීමිත පියාත් සමඟ ඔබ රාජයෝගා ඉගෙන ගන්නා බව ඔබගේ බුද්ධියට වැටහෙයි. ඔබ හොඳින් ඉගෙන ගත්තොත් ඔබට ද්විත්ව ඔටුන්නක් හිමි වෙයි. මෙය ඉතා විශාල පාසැලකි! රාජධානියක් ස්ථාපනය කෙරෙමින් තිබෙයි. බොහෝ විවිධාකාර වැසියන් සිටියි. රාජධානිය නොකඩවා වැඩෙයි. අඩුවෙන් ඥානය ගන්නා අය පසුව පැමිණෙයි. ඔබ උත්සාහ ගන්නා තරම අනුව මුලට පැමිණෙයි. මෙම නාටකය පෙර සිටම තීරණය වූ එකකි. මෙම නාටක චක්‍රය නැවත නැවතත් සිදු වෙයි. ඔබ දැන් පරම පියාගෙන් ඔබගේ උරුමය ලබා ගනිමින් සිටියි. පරම පියා පවසන්නේ පාරිශුද්ධ වන්න! යම් කෙනෙක් බාධක පමුණුවන්නේ නම් ඔබ කිසිදු සැළකිල්ලක් නොදැක්විය යුතුයි. අඩුම තරමින් චපාති කැබැල්ලක් හෝ ඔබට ලැබෙයි. ඔය දරුවන් උත්සාහ ගත යුතුයි, එවිට ඔබට සිහිපත් කිරීමේ සිටීමට හැකි වෙයි. බාබා ඔබට භක්ති මාර්ගයේ නිදසුන කියයි වන්දනාමාන කරන අතරතුරදි බුද්ධියේ යෝගාව පිටත සැරිසරන්නේ නම්, ඔහු තම කන් දෙක ඇද ගනී, එසේත් නැත්නම් තමන්ගේ කම්මුලට පහරක් ගසා ගයි. මෙය ඥානයයි. මෙහි ප්‍රධානතම දේ සිහිපත් කිරීමයි. ඔබට සිහිපත් කිරීමේ සිටිය නොහැකි නම් තමන්ටම කම්මුල් පහරක් ගසා ගන්න! මායා මාව පරාජය කරන්නේ ඇයි? මම දුර්වලද? මම ඇයව පරාජය කළ යුතුයි. ඔබ තමන් පිළිබඳව මනා අවධානයකින් සිටිය යුතුයි. තමන්ගෙන් විමසන්න මම එවැනි මහාවීරයෙක්ද? ඔබ අන් අයවත් මහාවීරයන් බවට පත් කරවීමට උත්සාහ ගත යුතුයි. ඔබ අන් අයව තමන් හා සමාන කරවන තරමට, ඔබට ලැබෙන තත්ත්වයද උසස් වෙයි. රාජධානියේ වාසනාව හිමිකර ගැනීමට ඔබ තරඟයේ දිවිය යුතුයි. මා තුළ කෝපය තිබේ නම්, වෙනත් කෙනෙකුට කෝප නොවන්න යැයි මා කියන්නේ කෙසේද ? මෙය අවංකත්වය නොවෙයි. ඔබ ලජ්ජාවට පත් විය යුතුයි. ඔබ අන් අයට විස්තර කර ඔවුන් උසස් වනමුත්, ඔබ තවමත් පහත් තත්ත්වයක සිටී නම්, එය කුමන අන්දමේ උත්සාහයක්ද? (පණ්ඩිතගේ කතන්දරය). පරම පියා සිහිපත් කිරීමෙන් ඔබ විෂ සහිත සාගරයේ සිට කිරි සයුරට යයි. පරම පියා මෙතැන අසුන් ගෙන මේ සෑම නිදසුනක්ම විස්තර කර දෙන අතර ඒවා ඉන්පසු භක්ති මාර්ගයේ නැවත කියනු ලැබේ. ගුම් නද දෙන සලබයාගේ නිදසුනද තිබේ. ඔබ බ්‍රහ්මිණ්වරුන්, බී කේ ලා, සත්‍ය බ්‍රහ්මිණ්වරුන්ය. ප්‍රජාපිතා බ්‍රහ්මා සිටින්නේ කොහිද? ඔහු අනිවාර්යෙන්ම මෙහි සිටිය යුතුයි. ඔහු එහි ඇත්තේ නැත. ඔය දරුවන් බොහෝ දක්ෂ විය යුතුයි. බාබාගේ සැලැස්ම නම් සාමාන්‍ය මිනිසුන් දෙවි දේවතාවරුන් බවට පරිවර්ථනය කිරිමයි. මෙය පැහැදිලි කිරීමට පිංතූරය තිබේ. ලියන වැකිද ඊට ගැලපෙන අයුරින් තිබිය යුතුයි. ගීතාවේ දෙවියන්ගේ සැලැස්ම මෙයයි. බ්‍රහමිණ්වරුන් වන අපි ඉහළම කොණ්ඩ ගැටයයි. එක් අයෙක් ගැන පමණක් කතා කළ නොහැක. ප්‍රජාපිතා බ්‍රහ්මා සිටින බැවින්, ඉහළම බ්‍රහ්මිණ්වරුන් ද සිටිති. බ්‍රහ්මා, සෑම බ්‍රහ්මිණ්වරයෙකුගේම පියායි. මේ කාලයේදී පවුල අති විශිෂ්ඨයි. ඔබ ඉන්පසු දේවතා පවුලේ කොටසක් බවට පත්වෙයි. ඔබ දිනා ගන්නා ලොතරැයිය නිසා, මේ කාලයේදී ඔබ බොහෝ සතුට අත් විඳී. ඔබ බොහෝ සෙයින් කීර්තිමත් වෙයි. මව්වරුන්හට නමස්කාර වේවා! ඔබ ශිව් ශක්ති හමුදාවයි, එසේ නොවේද? ඒවා සෑම දෙයක්ම බොරු. ඒවා බොහොමයක් (විවිධ කණ්ඩායම්) තිබෙන නිසා මිනිසුන් අවුලට පත් වෙයි. මේ නිසයි

රාජධානියක් ස්ථාපනය කිරීමට උත්සාහය අවශ්‍ය වන්නේ. පරම පියා පවසන්නේ මෙම නාටකය පෙර තීරණය වූවකි. මට ද එහි කොටසක් තිබේ. මම සර්ව බලධාරියායි. මා සිහිපත් කිරීමෙන් ඔබ පාරිශුද්ධත්වයට පත්වෙයි. ශිව් බාබා බලවත්ම කාන්දමයි. ඔහු වාසය කරන්නේ සැමටම වඩා ඉහළ ස්ථානයේය. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබ උපත් 21 කට බාබාගේ අසීමිත උරුමකරුවන් වී ඇති බවට නිරන්තර කුල්මත්භාවය සහ සතුට රඳවා ගන්න. ඔබ උරුමකරු වූ ඒකායන කෙනාව අනිවාර්යෙන්ම සිහිපත් කළ යුතුයි. ඒ සමඟම ඔබ පාරිශුද්ධ ද විය යුතුයි.
2. පරම පියා ඔබට උගන්වන උසස් ක්‍රියාවන් පමණක් කරන්න. ශ්‍රීමත් ගැනීම දිගටම සිදු කරන්න.

**වරදානය:** ඔබ භෞතික ලෝකය සහ ශරීර වල අවධානය ඉක්මවා සිට, සූක්ෂම දේශයේ ඇඳුමපලදිත්වා.

වත්මන් ලෝකයේ මිනිසුන් ඇඳුම් අඳින්නේ ඔවුන්ගේ කාර්යයට අනුවයි. ඒ අන්දමින්ම, ඔබගේද කාර්යයට සහ කාලයට අනුව ඔබට ඇඳුමක් පැලඳිය හැක. එක මොහොතක ශාරීරික වන්න, ඊළඟ මොහොතේ සූක්ෂම වන්න. මේ අන්දමින් බොහෝ ස්වරූප ඇති කෙනෙක් වන්න, එවිට ඔබට සියලු ස්වරූපයේ සතුට අත්විඳින්නට හැකි වෙයි. මෙය ඔබගේම ස්වරූපයයි. අන් අයගේ ඇඳුම් ඔබට සරි ලන්නේ හෝ නැතත් ඔබට තමන්ගේම ඇඳුම් පහසුවෙන් ඇඳිය හැක. එබැවින් මෙම ආශිර්වාදය ප්‍රායෝගික කරගන්න, එවිට ඔබට අව්‍යක්ත හමුවක අද්විතීය අත්දැකීම් ලබා ගත හැක.

**පාඨය:** සියලු දෙනා කෙරෙහි ගෞරවය ඇති අයට නිදසුන් විය හැක. ඔබ ගෞරවය ලබා දුන් විට පමණයි ඔබට ගෞරවය ලබා ගැනීමට හැකි වන්නේ.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: යෝගා බලයෙන් ඔබගේ මනසින් තමන් මත සහ අන් අය මත පර්යේෂණ සිදු කරන්න.**

ඔබ ඔබේ භෞතික කටයුතු සඳහා දෛනික කාලසටහනක් සකසා ගන්නා ආකාරයටම, ඔබේ මනසෙහි බලවත් තත්ත්වය සඳහා වැඩසටහනක් සකස් කරන්න, එවිට ඔබ කිසි විටෙකත් කලබල නොවනු ඇත. ඔබේ මනස ඔබේ බලවත් සිතිවිලි තුළ කාර්යබහුල වන තරමට, ඔබට වැඩි කාලයක් මනස ව්‍යාකූල නොවී තබා ගැනීමට හැකි වනු ඇත. ඔබේ මනස නිරන්තරයෙන් සකස් කර ඇති විට, එනම්, එය ඒකාග්‍ර වී ඇති විට, ඔබේ යහපත් කම්පන ස්වයංක්‍රීයව සෑම තැනකම පැතිරී සේවය සිදු වේ.